(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 463.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 ජූනි මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4788/'14

1.

ගරු අශෝක් අබේසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) එක් වර්ෂයක් තුළ යල සහ මහ කන්න දෙක වගා කිරීම සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) දැනට රට තුළ නිෂ්පාදනය කරන බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(iii) අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජාතික බීජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5575/'14

2.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දැනට ක්‍රියාත්මක වන ආයුර්වේද පනත හඳුන්වා දුන් වර්ෂය කවරේද;

(ii) මේ වන විට එම පනත සංශෝධනය කර ඇති වාර ගණන කොපමණද;

(iii) එය අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iv) මෙතෙක් එම පනත සංශෝධනය කර නොමැති නම්, එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන් හඳුන්වනු ලබන්නේ වෛද්‍ය නිලධාරීන් ලෙස ද; නැතහොත්, වෛද්‍ය වෘත්තිකයන් ලෙස ද;

(ii) ඔවුන් එම නාමයෙන් හැඳින්වීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5708/'14

3.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ මොණරාගල දිස්ත්‍රික්කය තුළ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී යෝජනා ක්‍රමය යටතේ නිවාස පහසුකම් ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;
(iii) එම යෝජනා ක්‍රමය සඳහා වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;
(iv) එකී මුදල් ලබා ගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් පවුල් වෙත ලිඛිත පොරොන්දුවක් ලබා දී තිබුණේද;
(ii) එකී පොරොන්දුව අනුව මෙතෙක් නිවාස ලැබී නොමැති පවුල් සඳහා නිවාස ලබා දීමට පියවර ගන්නේද;
(iii) ඒ සඳහා ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5759/'14

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ කුරගල ඓතිහාසික පුදබිම තුළ කැනීම් කටයුතු සිදු කිරීම නවතා තිබේද;
(ii) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරගල පූජා භූමියට අයත් භූමි ප්‍රමාණය කොපමණද;
(ii) එම භූමි ප්‍රමාණයෙහි මායිම් නිර්ණය කර තිබේද;
(iii) කැනීම් මගින් ලබා ගත් පුරා වස්තු රැක ගැනීමට පියවර ගෙන තිබේද;
(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කුරගල පූජා භූමියේ බෞද්ධ අයිතිය තහවුරු කිරීමට කටයුතු කරන්නේද;
(ii) එහි කැනීම් අඛණ්ඩව සිදුකිරීමට අවශ්‍ය පියවර ගන්නේද;
(iii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5931/'15

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි ව්‍යසනයෙන් නිවාස අහිමි වූ මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන් නිවාස සඳහා මේ වන විට ඔප්පු ලබා දී තිබේද;
(ii) එම ඔප්පු ලබා දී නොමැති නම්, ඊට හේතු කවරේද;
(iii) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දගොඩැල්ල (H.H.O. නිවාස), අභිමන්පුර, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදවත්ත (ලුණුකලපුව), මුදියන්සේවත්ත සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ලගේවත්ත, තුඩාව, කොඩිකාර ගොඩනැගිල්ල සහ ලොරන්ට සිටි යන ස්ථානවල ලබා දී ඇති නිවාස සඳහා ස්වාධීනමය දේපළ ලෙස හෝ තනි තනි නිවාස ලෙස හෝ ඔප්පු ලබා දිය හැකි බවට ජාතික නිවාස අධිකාරිය නිර්දේශ කර තිබේද;

(iv) එම නිවාසවලට ඔප්පු ලබාදීමේ කාර්යය සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට පැවරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(v) සහාධිපත්‍ය දේපළ පදනමින් හෝ තනි නිවාස අයිතිය යටතේ හෝ ඉහත (iii) හි සඳහන් නිවාසලාභීන්ට ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5939/’15

6\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගරු ශිරානි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමියගේ සභාපතීත්වයෙන් පත්කරන ලද ආයුධ ජාවාරම ගැන විමසා බැලීම සඳහා වූ කොමිසම විසින් වාර්තාවක් සකසා තිබේද;

(ii) එම වාර්තාව ප්‍රකාශයට පත් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6026/’15

7\.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් ජනාධිපතිවරයා සහ හිටපු ජනාධිපතිවරුන් අතරින් එල්. ටී. ටී. ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම් හේතුවෙන්, දේශීය හෝ විදේශීය වශයෙන් වැඩිම ජීවිත තර්ජනයකට ලක්වී ඇති අය කවුරුන්ද යන්න බුද්ධි අංශ ඇතුළු වෙනත් තොරතුරු ඇසුරින් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය විශ්‍රාම යන අවස්ථාවේ ලබා දී තිබූ ආරක්ෂකයින් සංඛ්‍යාව සහ මේ වන විට එතුමියගේ ආරක්ෂක ඒකකයට අයත් ආරක්ෂකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා තනතුරින් ඉවත්ව යන විට ලබා දී තිබූ ආරක්ෂකයින් සංඛ්‍යාව සහ මේ වන විට ලබා දී ඇති ආරක්ෂකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) හිටපු ජනාධිපතිවරුන්ට ලබා දී තිබූ ආරක්ෂාව අඩු වැඩි කිරීමට අදාළව යොදා ගන්නා නිර්ණායක කවරේද;

(iv) ඒ සම්බන්ධයෙන් තීරණ ගනු ලබන අය සහ එකී වගකීම භාරව ඇති අය කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6034/’15

8\.

ගරු විජිත හේරත් මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමියෝපති පනත අනුව වර්ෂ 2006 - 2011 දක්වා කාල සීමාව සඳහා පත්කර තිබූ හෝමියෝපති වෛද්‍ය සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14 වගන්තිවලට පටහැනිව 2009.10. 29 දින විසුරුවා හැර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් 2006 වර්ෂයේ පත්වූ එකී වෛද්‍ය සභාවේ සාමාජිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්;

(iii) විසුරුවන ලද වෛද්‍ය සභාව වෙනුවට එවකට විෂයභාර අමාත්‍යවරයා විසින් නීත්‍යානුකූල නොවන අතුරු කමිටුවක් පත් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් පත් කිරීම අනුමත කරන්නේද;

(ii) එම අතුරු කමිටුව විසින් සිදු කළ අංක 184 සිට 275 දක්වා වෛද්‍යවරුන් ලියාපදිංචිය තුළින් හෝමියෝපති පනත උල්ලංඝනය වී තිබේද;

(iii) එසේ නම්, එම පත්වීම් අවලංගු කරන්නේද;

(iv) අවලංගු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හෝමියෝපති පනතේ 20 වැනි වගන්තිය යටතේ ලේඛකාධිකාරීවරයෙකු පත්කිරීමට වෛද්‍ය සභාවකට පමණක් ඇති බලය අභිබවා එවකට පැවති දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම්. ඒ. පෙරේරා මහතාව ලේඛකාධිකාරී ලෙස පත්කිරීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, එම පත්කිරීම නිවැරදි කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6076/’15

9\.

ගරු ටී. බී. ඒකනායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තනය යටතේ රාජ්‍ය සේවකයින් සඳහා යතුරුපැදි ලබා දීමට අයකළ රු.50,000/=ක මුදල ආපසු ලබා දෙන බවට දින 100 වැඩ සටහනෙහි ඇතුළත් වූ පොරොන්දුවට අනුව, මේ වන විට එම මුදල් ආපසු ගෙවීම ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, මේ වන විට මුදල් ආපසු ගෙවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5760/’14

10\.

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලේ අගය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) මෙම මුදල වැය කළ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වැඩ සටහන් මගින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා එවකට පැවති තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සිදු කළ කටයුතු කවරේද;

(ii) 2014 වර්ෂයේදී ඉදිරිපත් වූ නව නිපැයුම් කවරේද;

(iii) එම නව නිපැයුම් ඉදිරිපත් කළ පුද්ගලයන් කවුරුන්ද;

(iv) ඔවුන්ට ලබා දුන් අනුග්‍රහයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මුදල වැඩි කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, වැඩි කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) එම මුදල වැය කිරීමට ඇති සැලසුම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6027/'15

11\.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, 228B තඹලගමුව ග්‍රාම නිලධාරී වසමේ මොල්ලිපොතාන, පැරකුම් පෙදෙස, අංක 05 හි පදිංචි ඊ. කේ. ජී. ජයතිලක පවුල සඳහා රු. 2000/- ක සමෘද්ධි දීමනාවකුත්, එම වසමේ ම මොල්ලිපොතාන, පැරකුම් පෙදෙස, අංක 131 හි පදිංචි සිව්දෙනෙකුගෙන් යුත් යූ. ජී. අනුලාවතී පවුල සඳහා රු. 3000/- ක සමෘද්ධි දීමනාවකුත් ලැබිය යුතුව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි දීමනා ලැබිය යුතු වුවද, දැනට ඊ. කේ. ජී. ජයතිලක පවුල සඳහා රු. 1000/- ක දීමනාවක් සහ යූ. ජී. අනුලාවතී පවුල සඳහා රු. 2000/-ක දීමනාවක් ලබා දීමට හේතුව කවරේද;

(ii) අනිවාර්ය ඉතුරුම් මුදල හැරුණ විට සත්‍ය වශයෙන්ම මෙකී පවුල් දෙක සඳහා ලැබිය යුතු සමෘද්ධි දීමනාව ඔවුන්ට ලබා දෙන්නේද;

(iii) එසේ නම්, එම ගෙවීම ආරම්භ කරන දිනය කවදාද;

(iv) එම දීමනාවට හිඟ මුදල ද එක් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6077/'15

12\.

ගරු ටී. බී. ඒකනායක මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතුරු අයවැයේදී 200% කින් වැඩි කළ සමෘද්ධි දීමනා ප්‍රතිලාභ මහජනතාවට ලබා දෙන දිනය කවරේද;

(ii) එම ප්‍රතිලාභ ලබාදීමේදී සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ නම් ලැයිස්තු සංශෝධනය කරන්නේද;

(iii) එසේ නම්, එම සංශෝධන ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සිදු කරන්නේද;

(iv) එම දීමනා පත්‍ර වටිනාකම් සඳහා ප්‍රතිලාභීන් තෝරාගන්නා ක්‍රමවේදයන්/ නිර්ණායකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5761/'14

13\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට විදේශ රටවල අත් අඩංගුවේ පසු වන ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අත් අඩංගුවේ පසුවන රටවල් හා එක් එක් රටේ සිටින ධීවරයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අත් අඩංගුවේ පසුවන එක් එක් ධීවරයාගේ නම, ලිපිනය, දුරකථන අංකය හා අත් අඩංගුවේ සිටි කාල සීමාව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද;

(ඇ) (i) අත් අඩංගුවට පත්වන ධීවරයන් කඩිනමින් මුදා ගැනීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) ධීවරයන් මුහුදු සීමා උල්ලංඝනය කිරීම වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) අත් අඩංගුවට පත් ධීවරයන් නිදහස් වූ පසු තම රැකියාව නැවත ආරම්භ කිරීම සඳහා සහාය ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6082/'15

14\.

ගරු ටී. බී. ඒකනායක මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් අවසන් කිරීමට බලාපොරොත්තු වන කාල සීමාව කවරේද;

(ii) යාපහුව හා ගල්ගමුව ආසන සඳහා මහවැලි ජලය ලබා දීම සඳහා වන සැලසුම අනුව හක්වටුනාව, පීල්ල වේලි මාර්ගවල ඉදිකිරීම් ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නේද;

(iv) පොල්පිතිගම ආරම්භ කළ වාරිමාර්ග කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කරන්නේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, 2015 ජූනි මස 24 වැනි බදාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. පූ. භා. 10.30ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2015 ජූනි මස 24 වැනි බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

4.

ගරු අජිත් කුමාර මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍යවරයා විසින් අතුරු අයවැයක් ඉදිරිපත් කරමින් 2015.01.29 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී කරන ලද ප්‍රකාශය තුළ අඩංගු වූ පෞද්ගලික අංශයේ වැටුප් හා වේතන සඳහා එක් සේවකයකුගේ මාසික වැටුප රු. 2500කින් වැඩි කරන ලෙසට වූ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඇතැම් වර්ගවල සේවකයන්ට සේවා යෝජකයන් විසින් අයවැය සහන දීමනාවක් ගෙවීම සඳහා ද, ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,— 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ සංචාරක හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මැයි 05 දිනැති අංක 1913/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

වරාය හා නාවික අමාත්‍යතුමා,— නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනත යටතේ නියෝග,— 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 10 වැනි වගන්තිය යටතේ මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 අගෝස්තු 28 දිනැති අංක 1877/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

කම්කරු අමාත්‍යතුමා,— පඩි පාලක සභා ආඥාපනත යටතේ නියෝග,— (136 වන අධිකාරිය වන) පඩි පාලක සභා ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015.06.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,700,000,000 සිට රු. 2,200,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |

| | | |
|---|---|---|
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,102,000,000 සිට රු. 6,602,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 850,000,000 සිට රු. 1,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවි කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000 සිට රු. 25,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවි කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,900,000,000<br>රු. 2,500,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,500,000,000<br>රු. 2,250,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවි කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000<br>රු. 170,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |

| | | |
|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 " කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000 සිට රු. 450,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2014 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතියට යටත්ව මේ සමග දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල පහත දැක්වෙන විෂය අංකවලට අදාළ වන්නා වූ පනතේ තෙවන උපලේඛනයේ තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක IIIහි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි. 14001, 18201, 10501, 22801, 20801, 27701, 30301, 26901, 27001, 27201, 24201, 28601, 10201, 25601, 25801, 28201, 28501, 11601, 28801, 30601, 27901, 27801, 27401, 27501, 21901, 17801, 12601, 11101, 18801, 21101 සහ 19001.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට රු. | දක්වා රු. | සිට රු. | දක්වා රු. | සිට රු. | දක්වා රු. | |
| 1 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 14001 | 7,000,000 | 10,000,000 | 3,700,000 | 4,000,000 | - | - | 1 |
| 2 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය | 18201 | 5,000,000 | 8,000,000 | 1,100,000 | 4,100,000 | - | - | 2 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 10501 | 140,000,000 | 170,000,000 | 60,000,000 | 90,000,000 | - | - | 3 |
| 4 | අධිකරණ අමාත්‍යාංශය | 22801 | 260,420,000 | 290,420,000 | 170,000,000 | 175,000,000 | 850,000,000 | 1,100,000,000 | 4 |
| 5 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | 9,000,000 | 12,000,000 | - | - | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 25,000,000 | 24,000,000 | - | - | 6 |
| 7 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 7 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | 23,000,000 | 18,000,000 | 90,000,000 | 100,000,000 | 8 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - අම්පාර | 27001 | - | - | 35,000,000 | 30,000,000 | - | - | 9 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 65,000,000 | - | - | 10 |
| 11 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 24201 | - | - | 2,000,000 | 1,700,000 | - | - | 11 |
| 12 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 28601 | - | - | 12,000,000 | 11,500,000 | - | - | 12 |
| 13 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 10201 | 15,000,000 | 12,000,000 | 9,500,000 | 8,500,000 | - | - | 13 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 25601 | - | - | 56,000,000 | 53,000,000 | - | - | 14 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 25801 | - | - | 51,000,000 | 46,000,000 | - | - | 15 |
| 16 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 28201 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 16 |
| 17 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 150,000,000 | 120,000,000 | - | - | 17 |
| 18 | සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 11601 | 6,000,000 | 7,500,000 | - | - | - | - | 18 |
| 19 | මිනුම්පති දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 86,000,000 | - | - | 19 |
| 20 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 385,000,000 | 290,000,000 | - | - | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 27901 | - | - | 30,000,000 | 26,000,000 | - | - | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | - | - | 38,000,000 | 32,000,000 | - | - | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | 27401 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 23 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොලොන්නරුව | 27501 | - | - | 18,000,000 | 15,000,000 | - | - | 24 |
| 25 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | 8,000,000 | 8,011,000 | - | - | - | - | 25 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 17801 | 4,000,000 | 5,000,000 | - | - | - | - | 26 |
| 27 | අධ්‍යාපන අමාත්‍යාංශය | 12601 | - | - | 680,000,000 | 675,000,000 | - | - | 27 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 710,000,000 | 653,000,000 | - | - | 28 |
| 29 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 18801 | 2,000,000 | 2,060,110 | - | - | - | - | 29 |
| 30 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | - | - | 45,000,000 | 44,000,000 | - | - | 30 |
| 31 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 19001 | - | - | 83,000,000 | 60,000,000 | - | - | 31 |
| | එකතුව | | 456,420,000 | 524,991,110 | 2,905,300,000 | 2,666,700,000 | 940,000,000 | 1,200,000,000 | |

අත්සන් කළේ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015 අප්‍රේල් 10 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1892/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 31 දිනැති අංක 1895/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 29 දිනැති අංක 1899/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 14 දිනැති අංක 1901/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 24 දිනැති අංක 1903/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.04.27 වැනි දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූරු ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය,— කලින් කලට සංශෝධනය කරන ලද (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, 25 වැනි වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 13 දිනැති අංක 1901/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.05.19 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතුය.

(අංක 974 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ 2014.10.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*33.

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.09.23 දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ගිණුම් වාර්තාව අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.11.13 දින සලකා බලන ලදී.)

*34.

නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2012,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය යටතේ 2014.09.24 දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*35.

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2012,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය අනුව 2014.09.10 දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ සහ පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*36.

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය අනුව 2014.09.24 දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ සහ පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*37.

උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2012,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2014.08.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(තාක්ෂණ සහ පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.10.10 දින සලකා බලන ලදී.)

*38.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*39.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*40.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත්

සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*41.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*42.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝග (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*43.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*44.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*45.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

46.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

47.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

48.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

49.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

50.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---